**චාවකච්චේරි නගර සභාව**

**යාපනය දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1:1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1:2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, චාවකච්චේරි නගර සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවතවා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට චාවකච්චේරි නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1:3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1:3:1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1:3:2 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වටිනාකම රු.291,644 ක් විය.

1:3:3 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.88,000 ක් වටිනා ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1:3:4 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) නගර සභා ආඥා පනත | |
| (i) 76 වගන්තිය | නගර සභා බල ප්‍රදේශයෙහි ඉදි කරන ලද අනුමැතිය නොලත් ගොඩනැගිලි පිළිබඳව සභාව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |

| වර්ෂය | අනුමැතිය නොමැතිව ඉදි කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව |
|---|---|
| 2008 | 18 |
| 2009 | 35 |
| 2010 | 27 |

| | |
|---|---|
| (ii) 159 (උ) වගන්තිය | සංස්කෘතික, ආගමික හා එවැනි වෙනත් සමාජ කාර්යයන්වලට එක් වර්ෂයක් තුළදී රු.2,500 ක මුදලක් නගර සභාවට වැය කළ හැකි වුවත්, සංග්‍රහ වියදම් හා පෙර පාසැල් කාර්යයන්ට සභාව විසින් රු.12,839 ක මුදලක් ගෙවා තිබුණි. |
| (iii) 170 (i) වගන්තිය | හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු.60,000 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,552,010 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,654,208 ක් විය.

2:2 ආදායම් පරිපාලනය

2:2:1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපති විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 1,181 | 916 | 5,459 | 1,131 | 903 | 5,644 |
| බදු කුලී | 7,501 | 6,261 | - | 6,961 | 4,729 | |
| බලපත්‍ර ගාස්තු | 549 | 458 | - | 349 | 130 | |
| වෙනත් ආදායම් | 45,466 | 28,812 | 4,741 | 8,109 | 29,497 | 2,088 |

2:2:2 උසාවි දඩ මුදල්

2010 වර්ෂය සඳහා උසාවි දඩ මුදල් අය කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2:2:3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.2,671,845 ක් විය.

2:2:4 ලැබිය යුතු ආදායම්

පෙර කාල පරිච්ජේදවලට අදාලව හා 2010 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු, බදුකුලී, බලපත්‍ර හා වෙනත් ආදායම් ලෙස සභා අරමුදලට රු.10,199,846 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි

2:3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පුද්ගල පඩිනඩි | 35,364 | 21,210 | 14,154 | 31,842 | 23,448 | 8,394 |
| අනෙකුත් | 7,975 | 4,685 | 3,290 | 6,476 | 3,157 | 3,319 |
| උප එකතුව | 43,339 | 25,895 | 17,444 | 38,318 | 26,605 | 11,713 |
| මූලධන වියදම් | 79,194 | 19,380 | 59,814 | 77,305 | 12,624 | 64,681 |
| මුළු එකතුව | 122,533 | 45,275 | 77,258 | 115,623 | 39,229 | 76,394 |

2:4 මානව සම්පත් කළමනාකරණය

2:4:1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික මට්ටම | 03 | 01 |
| ද්විතියික මට්ටම | 35 | 29 |
| ප්‍රාථමික මට්ටම | 84 | 45 |
| වෙනත් (අනියම් / තාවකාලික) | - | 16 |
| එකතුව | 122 | 91 |

2:5 වත්කම් කළමනාකරණය
-----------------------------

2:5:1 ලැබිය යුතු ගිණුම්
---------------------

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.10,289,523 ක් වූ අතර, වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ රු.9,442,873 ක් විය.

2:5:2 අයවීමට ඇති සේවක ණය
----------------------------

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය හා අත්තිකාරම් ශේෂවල එකතුව රු.3,633,905 ක් වූ අතර, වර්ෂ 01 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ රු.121,928 ක් විය.

2:5:3 අචල ජංගම වත්කම්
-----------------------

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට වැඩි කාලයක් ඉක්මවා පැවතුණු අචල ජංගම වත්කම් වටිනාකම රු.241,156 ක් විය.

2:5:4 සමීක්ෂණය නොකළ වත්කම්
-------------------------------

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.268,784,706 ක් විය.

2:5:5 හඳුනාගත් හානි හා පාඩු
-----------------------------

විගණන නියැදි පරීක්ෂණවලට හා සභාව විසින් පවත්වා තිබුණු තොරතුරුවලට අනුව රු.13,653 ක් වටිනාකම වූ හානි හා පාඩු අනාවරණය විය.

2:6 අවිධිමත් ගනුදෙනු
----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී පළාත් පාලන කොමසාරිස්ගෙන් පහත සඳහන් ප්‍රදාන සභාවට ලැබී තිබුණි. එම ප්‍රදාන අදහස් කළ කාරණයන්ට යොදාගෙන නොතිබුණි.

| ප්‍රදානයේ ස්වභාවය | මුදල | ප්‍රදාන වැරදි ලෙස යොදා ගැනීම පිළිබඳ විස්තර |
|---|---|---|
| | රු. | |
| මාතෘ හා ළමා ප්‍රදාන | 30,000 | කාර්යාල කටයුතු සඳහා ලී බඩු මිලදී ගැනීම |
| සංරක්ෂණ (Conservancy) ප්‍රදාන | 29,804 | ගොඩනැගිලි අළුත්වැඩියා |

(ආ) තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා මේට්ට හා කොට්ට මිලදී ගැනීමට සභා අරමුදලින් රු.10,950 ක මුදලක් වැයකර තිබුණි.

2:7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 හා 2010 වර්ෂවලදී වීථි ලාම්පු 450 ක නව සම්බන්ධතාවයක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට රු.3,496,878 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. අදාල කාර්යය නිම වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එය නිරවුල් කර නොතිබුණි.

2010 වර්ෂය තුළ වීථි ලාම්පු නඩත්තු කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. ඒ අනුව වීථි ලාම්පු නඩත්තු කිරීමේ වියදම් ලෙස ලැබිය යුතු රු.5,600 ක මුදල ප්‍රතිපූර්ණය කර නොතිබුණ.

(ආ) රු.427,087ක මුදලක් බස් මගී ආවරණ ඉදි කිරීම සඳහා දරා තිබුණි. කාලගුණයෙන් ආරක්ෂා වන පරිදි මෙම ස්ථාන සැලසුම් කර ඉදි කර නොතිබුණි.

(ඇ) සභාව විසින් පවත්වාගෙන යන ගවඝාතකාගාරය සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා 2000 නොවැම්බර් 22 දිනැති අංක 1159/22 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. ගවඝාතක ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඝාතනය කරන ලද ගවයන් සංඛ්‍යාව පිළිබඳ විස්තර ලියාපදිංචි කර නොතිබුණි.

2:8 කාර්ය සාධනය

සභාව විසින් ගිණුම් වර්ෂය ආරම්භයේදී ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ඒ අනුව, ඉටු කරගත යුතු අපේක්ෂිත අරමුණු හා ඒ පිළිබඳ ප්‍රගතිය තහවුරු කරගත නොහැකි විය.

2:9 අභ්‍යන්තර විගණනය

සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් පරිපාලනය

(ආ) අයවැය පාලනය

(ඇ) මෝටර් වාහන උපයෝජනය

(ඈ) ප්‍රදාන